කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2015

2020 පෙබරවාරි - අප්‍රේල්

සමාජීය විද්‍යා පීඨය

# සමාජවිද්‍යාව

ප්‍රායෝගික සමාජවිද්‍යාව SOCI E 1025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 8 යි. කාලය : පැය 03 යි.

---

1. ප්‍රායෝගික සමාජවිද්‍යාව යනු කුමක්දැයි පැහැදිළි කර රටක ප්‍රගතිය ඇතිකිරීම වෙනුවෙන් ප්‍රායෝගික සමාජ විද්‍යාඥයෙකුගේ කාර්යභාරය කෙසේ විය යුතු දැයි විස්තර කරන්න.

2. සංවර්ධනය යනු කුමක්දැයි නිර්වචනය කර සංවර්ධනයේ විවිධ පැතිකඩ පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කරන්න.

3. නවීකරණ ක්‍රියාවලියෙහි සමාජ සංස්කෘතික ප්‍රතිඵල විස්තර කරන්න.

4. ප්‍රධාන සංවර්ධන සැලසුම් වර්ග විස්තර කර සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේදී අවධානය යොමුකළ යුතු කරුණු පෙන්වා දෙන්න.

5. බහුවාර්ගික රටක තිරසාර ජාතික සංහිඳියාව ඇතිකිරීම වෙනුවෙන් ගතහැකි ක්‍රියාමාර්ග මොනවාදැයි ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

6. සියදිවි නසා ගැනීම සමාජ ප්‍රශ්නයක් ලෙස හඳුනා ගත හැක්කේ කෙසේ දැයි පහදන්න.

7. 'ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශක අගය සංවර්ධනයේ මධ්‍ය රටවල අගය නියෝජනය කරයි.' ශ්‍රී ලංකාව ඉහල මානව සංවර්ධන දර්ශක අගයක් හිමි කර ගැනීම වෙනුවෙන් බලපාන ලද සමාජ සුබසාධන උපාය මාර්ග මොනවාදැයි පැහැදිලි කරන්න.

8. පහත සඳහන් මාතෘකා දෙකකට (02) පමණක් සමාජ විද්‍යාත්මක සටහන් ලියන්න.
   1. එමිල් ඩර්කයිම්
   2. බටහිරකරණය
   3. ශ්‍රී ලංකාවේ නූතන ජනගහන ප්‍රවනතා
   4. දුගීභාවය මැඩලීම

*************************